**පොල් සංවර්ධන අධිකාරිය - 2018**

------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොල් සංවර්ධන අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණනයේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,අධිකාරිය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිත අංක 19 ප්‍රකාරව සේවක ප්‍රතිලාභ පාරිතෝෂිත ගණනය කිරීම සඳහා ආයු ගණක තක්සේරු කිරීමේ ක්‍රමය (Acturial Valuation Method) කාලානුරූපීව සිදු කල යුතු වුවද 2018 දෙසැම්බර් 31 දිනට වූ පාරිතෝෂික වෙන් කිරීම එවැනි ආයු ගණක තක්සේරුවක් සිදු කිරීමකින් තොරව රු.38,393,469 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ප්‍රමිතය ප්‍රකාරව ආයු ගණන තක්සේරු කිරීමේ ක්‍රමය පදනම් කරගෙන සේවක පාරිතෝෂිත ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පොල් පර්යේෂණ මණ්ඩලයට බදු දීමේදී ගිණුම් වලින් ඉවත් කර නැවත අධිකාරිය වෙත 2016 වර්ෂයේදී පවරාගෙන තිබූ දුන්කන්නාව වත්තෙහි කොහු මෝලට අයත් පිරිවැය රු.8,724,796 ක යන්ත්‍රෝපකරණ, පරිගණක හා කාර්යාල ලී බඩු උපකරණ ඇතුළු අයිතම 164 ක් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | පොල් පර්යේෂණ මණ්ඩලයට බදු දීමට ගිණුම් වලින් ඉවත් කරන ලද සහ 2016 වර්ෂයේ නැවත අධිකාරියට පවර ගන්න ලද දුන්කන්නාව වත්තේහි සහ කොහු මෝලට අයත් යන්ත්‍රෝපකරණ, පරිඝණක, කාර්යාල උපකරණ සහ උපාංග සියල්ල නැවත ප්‍රත්‍යාගණනය සිදුකර 2019.12.31 දිනෙන් අවසන් අවසන් වර්ෂය වෙනුවෙන් පිළියෙළ කරනු ලබන මූල්‍ය ප්‍රකාශනයේ දැක්වීමට පියවර ගනු ඇත. | අධිකාරිය වෙත පවරාගනු ලැබූ වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| | රු. | රු. | රු. | | |
| දිසිදි පොල් මෝල් හිමියන්ට සපයන සේවාවන් සඳහා වූ ණයගැතියන් | 4,610,702 | 5,203,848 | 593,146 | 2018.12.31 දිනට දිසිදි මෝල් හිමියන්ගෙන් අයවිය යුතු බදු රහිත මුදල පමණක් ගිණුම් ගතකර ඇත. 2019.06.01 දින සිට සේවාව සපයන අවස්ථා අනුව මෝල් හිමියන් වෙත ඉන්වොයිසිය නිකුත් කිරීමට සැකසුම් සංවර්ධන අංශය පියවර ගෙන ඇති බැවින් 2019.06.01 දිනෙන් පසු NBT/VAT සමඟ අදායම ගිණුම්ගත කිරීමට පියවර ගෙන ඇත. | ලෙජර් ගිණුම් ශේෂය සහ අනුරූපි වාර්තා අනුව ශේෂය සමඟ සසදා වෙනසට හේතුව විගණනයට පැහැදිලි කළ යුතුය. |
| පෞද්ගලික සමාගමකින් ලැබිය යුතු ශේෂය | 182,011 | 33,150 | 148,861 | 2019 වසරේ පහත සඳහන් ලදුපත් යටතේ මෙම මුදල ලැබී ඇත. ලදුපත් අංක 120051, 120053, 121615, 121616, 121618, 119480 | අදාල සමාගම විසින් ඉදිරිපත් කර ඇති ශේෂ සනාථ කිරීම් අනුව වෙනසක් පවතින නිසා එය නිවැරදි කර ගත යුතුය. |

## 1.5.4 අවිනිශ්චිත ගිණුම්

--------------------

| විෂයය | මුදල | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| සමුච්චිත අරමුදල ගිණුම යටතේ පෙන්වා ඇති අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය | 1,871,776 | වසර 02 | මෙම විමසුමේ දක්වා ඇති රුපියල් 1,871,776/- මුදල හඳුනා නොගත් ශේෂයක් නොවේ. අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන දිසිදි මෝල් තුනක එනම් (අංක 68,81 සහ 128) තැන්පත් ගිණුම් තුනක ශේෂයන් වේ.මෙම ගිණුම් තුනට අදාලව විභාග වෙමින් පවතින නඩු වල අදාල තීන්දුව ලැබෙන තෙක් මෙම ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගත නොහැක. | මූල්‍ය ප්‍රකාශන වල අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂයක් පැවතීම යෝග්‍ය නොවන නිසා එය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

---------------------------------------------

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ)ණයගැතියෝ | 3,953,855 | ඉන්වොයිස් පත්/ශේෂ සනාථ ලිපි | දැනට සිදුවන ක්‍රමවේදය අනුව අදාල ඉන්වොයිස් පත මුදල් ලැබුණු පසු නිකුත් කරනු ලැබේ. 2019 ජුනි මස 01 සිට ඉන්වොයිස් පත් සේවය සපයන අවස්ථාවේම නිකුත් කිරීමට සැලසුම් කර ඇත. | නිවැරදි ක්‍රමවේදය අනුගමනය කළ යුතු අතර සෘජුවම විගණනය වෙත අදාල ශේෂයන් තහවුරු කරන ලෙස අදාල පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ)විවිධ ණයගැතියෝ | 3,976,192 | ශේෂ සනාථ ලිපි | ණයගැති සහ ණයහිමි ශේෂ සනාථ කරන ලෙස සියලුම ණයගැතියන් හා ණයහිමියන් වෙත ලිපි යවා ඇත.ලිපි සටහන් පිටපත් මුදල් අංශය සතුව ඇත. 2019 වසරේ මුදල් ලැබීම හා ගෙවීම පරික්ෂා කිරීමෙන් මෙම ණයගැති සහ ණයහිමි ශේෂ නිරවුල් කිරීම තහවුරු කරගත හැක. | සෘජුවම විගණනය වෙත අදාල ශේෂයන් තහවුරු කරන ලෙස අදාල පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) විවිධ ණයහිමියෝ | 9,734,871 | ශේෂ සනාථ ලිපි | ණයගැති සහ ණයහිමි ශේෂ සනාථ කරන ලෙස සියලුම ණයගැතියන් හා ණයහිමියන් වෙත ලිපි යවා ඇත.ලිපි සටහන් පිටපත් මුදල් අංශය සතුව ඇත. 2019 වසරේ මුදල් ලැබීම හා ගෙවීම පරික්ෂා කිරීමෙන් මෙම ණයගැති සහ ණයහිමි ශේෂ නිරවුල් කිරීම තහවුරු කරගත හැක. | එම |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෞද්ගලික සමාගමකින් ලැබිය යුතු රු. 31,550,000 ක මුදලක් වර්ෂ 14 ක කාලයක් අය නොවී පැවතුණි. | පෞද්ගලික සමාගමක් වන BCC ලංකා සමගම වෙතින් අයවිය යුතු රු.31,550,000/- මුදල අය කර ගැනීමට කටයුතු කර නොමැත, යන්න සඳහන් කිරීමට එකඟ විය නොහැක. මේ සම්බන්ධව අවස්ථා ගණනාවක් තුල ලිපි ගණනාවක් හුවමාරු වී ඇති අතර සාකච්ඡා වට ගණනාවක්ද අමාත්‍යාංශය මැදිහත්ව සිදුකර ඇත. BCC ලංකා සමගම ද මෙම මුදල් ගෙවීමට මහා භාණ්ඩාගාරයෙන් මුදල් ඉල්ලා ඇත. | අමාත්‍යංශය මහා භාණ්ඩාගාර සහ අදාල සමාගම සමග සාකච්ඡා කර මෙම මුදල නිරවුල් කර ගැනීමට ක්‍රියා කල යුතුය. |

**1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

**පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 පෙබරවාරි 15 දිනැති පො.සං.අ/පරි/කානි/2013/01 දරණ පොල් සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛය | | | |
| (i) අංක(02) ඡේදය | අත්තිකාරම් මුදලක් ලබා ගත් පුද්ගලයෙකු තවත් අත්තිකාරම් මුදලක් ඉල්ලුම් කරන්නේ නම් මුලින් ලබා ගත් අත්තිකාරම් මුදල පියවා තිබිය යුතු වුවද අවස්ථා 09 දී පුද්ගලයින් 06 දෙනෙකු වෙත ලබා දී තිබූ රු.846,200 ක පලමු අත්තිකාරම් මුදලක් පියවීමකින් තොරව නැවත රු.1,053,550 ක් අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණි. | අත්තිකාරම් මුදලක් ලබාගත් පුද්ගලයෙකු තවත් අත්තිකාරමක් ලබා ගැනීමට පෙර, මුලින් ලබාගත් අත්තිකාරම් නිරවුල් කිරීම සිදුකල යුතු වුවද අත්තිකාරම් මුදල් ඉල්ලුම් කිරීමේදී උපරිම අත්තිකාරම් මුදල් ලබාදීම අමුණා ඇති ලේඛණයේ පරිදි සීමා කර ඇත. නමුත් අවම සීමාවන්ට වඩා වැඩි අත්තිකාරම් මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වූවිටදී සභාපති තුමාගේ හෝ අධ්‍යක්ෂ තුමාගේ විශේෂ අනුමැතිය මත අත්තිකාරම් මුදල් නිදහස් කර ඇත. | චක්‍රලේඛයේ සඳහන් පරිදි පළමුව ලබාගත් අත්තිකාරම් මුදල පියවීමෙන් පසුව නැවත අත්තිකාරම් මුදල් ලබාදිය යුතුය. |
| (ii) අංක(05) ඡේදය | අත්තිකාරම් ලබා ගෙන නියමිත කාර්යය අවසන් වීමෙන් පසු රාජකාරී දින 03 ක් ඇතුළත සාධාරණ **හේතුවක්** නොමැතිව පියවීමට නොහැකි වුවහොත් ලබා ගත් මුළු මුදල සඳහා සියයට 2 ක දඩයක් අයකල යුතු වුවද අවස්ථා 24ක දී රු.1,527,950 ක මුදලක් දින 2 ත් දින 72 ත් අතර කාල පරාසයක් තුල ප්‍රමාද වී පියවා තිබියදි ඉහත සඳහන් පරිදි දඩයක් අයකර නොතිබුණි. | දැනට මුදල් අය කිරීම දිනකට 2% නොව වර්ෂයකට 2% ලෙස අයකර ගැනීමට සිදුකර ඇත. එහෙත් මෙසේ දැනට මුදල් අයකර ගැනීම වෙනුවට අංශ ප්‍රධානීන්ගේ අනුමැතිය මත අත්තිකාරම් ලබා දී නිරවුල් කිරීම සම්බන්ධව පූර්ණ වගකීම අංශ ප්‍රධානීන්ගේ අධීක්ෂණය මත සිදුකරන ලෙස 2019 මාර්තු මස පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී උපදෙස් දෙන ලදී. | අංශ ප්‍රධානීන්ගේ අධීක්ෂණය මත සාධාරණ කාලයක් ඇතුලත පියවීමට නොහැකි වන අත්තිකාරම් සඳහා චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2015 ජූලි මස 14 දිනැති අංක 03/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය | තත්කාර්යය අතුරු අග්‍රිමය ලබා ගන්නා නිලධාරියා විසින්ම එම කාර්යය නිම කල විගසම අත්තිකාරම් පියවිය යුතු වුවත් අවස්ථා 14 කදී ලබා ගත් අත්තිකාරම් රු 783,600 ක් පියවීමට මසකට වඩා වැඩි කාලයක් ප්‍රමාද වී තිබුණි. | අත්තිකාරම් මුදල් ලබා ගැනීම සිදුකර ඇත්තේ කාර්යාලයෙන් බාහිරව ක්ෂේත්‍රයේදී පවත්වන පුහුණු/ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වේ. එම වැඩසටහන් සඳහා බාහිර පාර්ශවයන් ගෙන් අමුද්‍රව්‍ය හා රැස්වීම් ද්‍රව්‍ය ආදී දේ සපයා ගැනීම සිදුකරන අතර ක්ෂේත්‍ර රාජකාරී වල නියැලෙන නිලධාරීන් එම වැඩසටහන් නිම කර අදාළ බිල්පත් කොටුව කාර්යාලයට ගෙනවිත් භාරදීමට හා අමතරව ලබා ගන්නා ලද ඉන්ධන බිල්පත් අදාළ රාජකාරී සමඟ ගැලපීම කිරීමට කාලයක් ගතවී ඇත. ඒ හැරුණු කොට අනෙකුත් අවස්ථාවලදී අදාළ ඉතිරි මුදල් කොටුව කාර්යාලයෙන් නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයට ගෙනගොස් භාරදීමේදී ඇතිවන ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා කඩිනමින් බැංකු ගත කර ඇත.<br><br>ඉදිරියේදී මෙම ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා ප්‍රවාහන අවශ්‍යතා විධිමත් සැලසුම් කිරීමටත් ඉන්ධන සඳහා අමතරව වැයවෙතැයි අපේක්ෂා කරන වියදම ඇස්තමේන්තුගත කර අත්තිකාරම් ලෙස ලබා ගැනීමටත්, අමුද්‍රව්‍ය හා රැස්වීම් ද්‍රව්‍ය මිලදීගැනීම් වලට අදාළ බිල්පත් කඩිනමින් ඉදිරිපත් කළ හැකි ආයතන වලින් පමණක් ලබා ගැනීමටත්, වැඩසටහන නිමකළ දිනට පසු දිනම බිල්පත් නිරවුල් කිරීමටත් අවශ්‍ය දැනුවත් කිරීම් සිදුකරන ලදී. | අත්තිකාරම් මුදල් පියවීම ප්‍රමාද වීමට හේතු සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන කඩිනමින් පියවීම සඳහා උපදෙස් ලබාදිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.74,288,048 ක අතිරික්තයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.140,413,563 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.66,125,515 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වෙනත් ආදායම් රු. 126,108,627 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය හා සැසඳීමේදී වෙනත් ආදායම් වල අඩුවීමක් සහ සැපයුම් අවශ්‍යතා හා අලුත්වැඩියා වියදම් වලද වැඩි වීමක් සිදු වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ජංගම අනුපාතය, ඉකුත් වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා 1:8 සිට 1:10 ඉහළ ගොස් තිබූ අතර දළ ලාභය හා ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 33 සිට 21 දක්වා සහ සියයට 31 සිට 19 දක්වාද අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වෙතින් අධිකාරිය වෙත අවුරුදු 04 ක පමණ කාලයක සිට අයවිය යුතු රු.7,060,032 ක මුදල ඉදිරියේදී පැවැත්වීමට නියමිත වැඩසටහන් සඳහා හිලව් කිරීමට රූපවාහිනී සංස්ථාව විසින් 2016 සැප්තැම්බර් 06 දිනැති ලිපිය මගින් එකඟ වී තිබියදී සිංහල අලුත් අවුරුදු උත්සවය වෙනුවෙන් 2018 අප්‍රේල් 10 සිට 15 දක්වා ප්‍රචාරය කරන ලද රූපවාහිනී වැඩසටහන් වෙනුවෙන් ගෙවිය යුතු රු.1,524,900 ක ශේෂය එම මුදලින් හිලව් කිරීමට කටයුතු නොකර මුළු මුදලම රූපවාහිනි සංස්ථාව වෙත ගෙවා තිබීම හේතුවෙන් ඉහත මුදල පියවීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. | රු.7,060,032.00 ක් මීට පෙර ජාතික රූපවාහිනියට ගෙවා ඇති අතර ඒ පිළිබඳ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණයක් කරමින් පවතී. එබැවින් ඔවුන්ගෙන් අදාල මුදල වෙනුවට රූපවාහිනී ආයතනය මඟින් දැන්වීම් ප්‍රචාරය කර හිලව් කිරීම සඳහා 2017.10.20 , 2016.10.06 සහ 2018.06.11 යන දිනයන්හි දි විමසන ලදී. එහෙත් ඒ පිළිබඳ නිසි පිළිතුරක් ලබා දී නොමැත. | දීර්ඝ කාලයක සිට අයවිය යුතු මුදල අය කර ගැනීමට හෝ ඒ වෙනුවට වෙනත් වැඩසටහනක් පැවැත්වීමට හෝ කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා අධිකාරියේ ලියාපදිංචි වී තිබුණද ප්‍රමිත තත්ත්ව සහතික ලබා ගෙන නොමැති ආයතන ඒ සඳහා යොමු කිරීමට එක් දිස්ත්‍රික්කයකට දෙදෙනෙකු බැගින් කර්මාන්තකරුවන් 20 දෙනෙකුට බහාලුම් 400 ක් බෙදා දීමට ක්‍රියාකාරී සැලැස්ම මඟින් රු.1,600,000 ක් වෙන්කර තිබුණද අධිකාරිය විසින් එය ක්‍රියාක්මක කර නොතිබුණි. | මෙයට හේතුව ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා 563/පීඩී/04 යටතේ පත්‍රිකාවක් ලෙස ඉදිරිපත් කර තිබුණද එහි තීරණ අංක 563.08 මඟින් මෙම ක්‍රියාකාරකම සඳහා අනුමැතිය ලබා දී නොතිබීමයි. අනුමැතිය ලබා ගත හැකි බවට අනුමාන කරමින් බහාලුම් ලබා ගැනීමට ප්‍රසම්පාදන කටයුතු සඳහා පාලන අංශය වෙතද ඉදිරිපත් කර තිබුණද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය නොලැබීම මත මෙම කටයුත්ත ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් නොලැබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කල යුතුය. |
| (ඇ) | අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව 2014 වර්ෂයේ සහ 2017 වර්ෂයේ මිලදීගෙන තිබූ රු.5,804,321 ක් වටිනා රසායනාගාර භාණ්ඩ තොග වලින් රු.3,461,702 ක් වටිනා තොග නිශ්කාර්යව පැවැතුණි | ගබඩාවේ පවතින තොග කෙරෙහි අනිවාර්යයෙන් සැලකිළිමත් වෙමින් ඊලඟ වසර සඳහා අවශ්‍යතා ඉල්ලුම් කරනු ලැබේ. සාමාන්‍යයෙන් ආනයනය කිරිමේ ප්‍රමාදයක සිදුවන විටද අඛණ්ඩව පරීක්ෂණ සිදුකිරිම පිණිස සාමාන්‍යයෙන් ඉදිරි වර්ෂයේ මාස 6-8 ක් පමණ කාලයකට ප්‍රමාණවත් වන පරිදි අවශ්‍ය වන තොගයක් ගබඩාවේ පවත්වා ගැනීම සාමාන්‍යය ක්‍රමවේදයයි.<br>මෙම අයිතම බොහොමයක් 2017 අගභාගයේදී සහ 2018 මුල සැපයුම්කරන ලද ඒවා වේ. 2017/2018 වර්ෂයන්හිදි අඩු ආදර්ශ ප්‍රමාණයක් පරීක්ෂණ සඳහා ලැබීම හේතුවෙන් ගබඩාවේ පවතින අයිතම භාවිතා කිරීම අඩුවී ඇත. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගෙන මිලදී ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඈ)** | පොල් ආශ්‍රිත නිෂ්පාදන වල ඇලවීම සඳහා අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව 2014 වර්ෂයේ **සිට** 2018 වර්ෂය **දක්වා** මිලදී ගෙන තිබූ රු.7,184,234 ක් වටිනා ස්ටිකර් රු.4,076,000 ක් වර්ෂ 02 කට වඩා වැඩි කාලයක් නිශ්කාර්යව පැවතුණි**.** | 2017 හා 2018 වර්ෂයන් තුළ පොල් නිෂ්පාදන ක්ෂේත්‍රය බිඳ වැටීමට ලක්වීම හේතුවෙන් අප අපේක්ෂා කළ අරමුණු කරා ළඟා වීමට නොහැකි විය.නමුත් 2019 වසරේ පොල් ආශ්‍රිත නිෂ්පාදකයින් පෙර පරිදි නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමත් සමඟ ස්ටිකර් ආකාර ලේබල් භාවිතය වැඩි වීමක් අපේක්ෂා කෙරේ. ඒ අතරම පොල්තෙල් කර්මාන්තයේ ප්‍රගමනය වෙනුවෙන් විශේෂ ව්‍යාපෘතියක් අරඹා ඇති බැවින්,තව දුරටත් මෙම ලේබල් භාවිතය වැඩි වනු ඇත. | මිලදී ගැනීමේදී අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගෙන මිලදීගැනීම පිළිබඳ දැඩි අවධානය යොමු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අධිකාරිය විසින් පොල් ගෙඩි වෙන්දේසිය සඳහා අන්තර්ජාලය මඟින් ලංසු තැබීමට අදාළ කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා පුද්ගලික සමාගමක් වෙත 2013 සිට 2016 දක්වා රු.1,018,100 ක් ගෙවා තිබුණද අන්තර්ජාලය හරහා වෙන්දේසිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඉහත වියදම නිෂ්කාර්යය වියදමක් බවට පත්ව තිබුණි. | පොල් වෙන්දේසිය අන්තර්ජාල ගත කිරීම වේගයෙන් ව්‍යාප්ත වී ගෙන යන ඩිජිටල් යටිතල පහසුකම් ක්‍රියාවලියට අනුගත වීමක් වන අතර පොල් වෙළෙඳ ක්ෂේත්‍රය තුල අන්තර්ජාල/පරිගණක භාවිතය පිළිබඳ ඇති සාක්ෂරතාව අඩු බැවින් (විශේෂයෙන් පොල් ගැණුම්කරුවන් හට) අන්තර්ජාලය හරහා පොල් වෙන්දේසිය පැවැත්වීමේ පසුගාමී තත්වයක් දැනට පැනනැගී ඇත. | අන්තර්ජාලය භාවිතා කිරීම සඳහා පවතින ගැටළු නිරාකරණය කර මෙය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |
| (ඊ) | අධිකාරියේ රසායනාගාරය නවීකරණය කිරීම සම්බන්ධයෙන් වූ රු.17,105,433 ක කොන්ත්‍රාත්තුව 2017 දෙසැම්බර් 25 දින නිම කළ යුතුව තිබුණ අතර එහි අධීක්ෂණ කටයුතු කරනු ලබන උපදේශන සමාගම වෙත රු. 1,400,000 ක් ගෙවා තිබුණද 2018 දෙසැම්බර් 31 දින වන විටද අදාළ නවීකරණ කටයුතු අවසන් කර නොතිබුණි. ඒ හේතුවෙන් රසායනාගාර පරීක්ෂණයන් සිදු කිරීමට නොහැකි වීම නිසා අධිකාරියට අහිමි වූ ආදායම රු.9,297,800 ක් වී තිබුණි. | මේ වන විට රසායනාගාර නවීකරණ කටයුතු සම්පූර්ණ කර ඇති අතර රසායනාගාර සේවා පුළුල් කිරීමට අමතරව දෛනිකව සිදුකරනු ලබන සෙසු සියළු පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා පරීක්ෂා කටයුතු සිදුකරමින් පවතී. | රසායනාගාර සේවා තව දුරටත් පුළුල් කර පරීක්ෂණ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (උ) | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ නිලධාරීන් දෙදෙනෙකුට ලබා දී තිබු වාහන දෙකක්, එම නිලධාරීන් අධිකාරියෙන් විශ්‍රාම යාම හා ඉවත් වීම හේතුවෙන් ධාවන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණු අතර ඒ වෙනුවෙන් 2018 සැප්තැම්බර් මස 08 දින සිට දෙසැම්බර් මස දක්වා ගෙවා තිබූ රු.752,100 ක කුලී මුදල අනාර්ථික වියදමක් වී තිබුණි. | මෙම වාහනයට අනුයුක්ත කල නිලධාරියා විශ්‍රාම යාම සමඟම සැප්තැම්බර් සිට දෙසැම්බර් මස දක්වා භාවිතයකින් තොරව මුදල් ගෙවීම සිදුකර ඇත. දැනට මෙම වාහනය වැඩ බලන අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) වෙත අනුයුක්ත කර ඇත. | මාසිකව කල්බදු වාරික ගෙවනු ලබනවාහන වලින් වඩාත් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | අධිකාරියේ සහතික ලත් පොල් තෙල් මිලදී ගැනීම සඳහා මහජනතාව හා පාරිභෝගිකයින් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මඟින් දැනුවත් කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම මඟින් රු.2,480,000 ක් වෙන් කර තිබුණද වර්ෂ අවසානය තෙක් මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා නොතිබුණි. | රාජ්‍ය රූපවාහිනී මාධ්‍ය ආයතන මඟින් ප්‍රචාරණය සඳහා රු.2,485,450/- ක් ලෙස මිල ගණන් පත් ලබා දී තිබුණි. එනමුත් මෙම වකවානුව තුළ රටේ පැවති දේශපාලන අස්ථිරබව හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයක් නොවූ බැවින් මෙම මුදල් ගෙවීමේ ගැටළුකාරී තත්වය මත දැන්වීමක් සකස් කිරීමට ආයතනයකට භාර දීමට හෝ එය මාධ්‍ය හරහා ප්‍රචාරණය කිරීමේ අවස්ථාව නොලැබුණි. | පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව මහජනතාව සහ පාරිභෝගිකයින් දැනුවත් කිරීම සඳහා සැලසුම් කළ පරිදි කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | | 2019 වසරේ ජූනි මස වන විට විද්‍යුත් මාධ්‍ය මඟින් ප්‍රචාරණ කටයුතු සිදු කිරීමට අදාළව සාකච්ඡා කර ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ රෝග නිවාරණ හා ප්‍රවර්ධන අංශයේ සහයෝගය ලබා ගැනීමට නියමිතය. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගබඩාවෙන් නිකුත් කර ඇති රු.6,084,957 ක් වටිනා ස්ටිකර් 3,529,793 න් ස්ටිකර් 1,271,834 ක් මෝල් හිමියන් වෙත විකුණා ඇති අතර ස්ටිකර් 1,069,391 ක් පමණක් සැකසුම් අංශයේ ගබඩා කර තිබුණි. ඒ අනුව ගබඩාවෙන් නිකුත් කර ඇති රු.1,402,507 ක් වටිනා ස්ටිකර් 1,188,568 ක ඌණතාවය පිළිබඳ අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ස්ටිකර් වල ඌණතාවය පිළිබඳව පරීක්ෂාවක් සිදුකර ඒ පිළිබඳව විගණනයට වාර්තා කල යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට අධිකාරියේ කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු 26 ක් පැවති අතර ඒ අතුරින් අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන), අධ්‍යක්ෂ අලෙවිකරණ (ජාත්‍යාන්තර), නීති නිලධාරී, පර්යේෂණ නිලධාරී, සැකසුම් සංවර්ධන නිලධාරී, ආර්ථික පර්යේෂණ නිලධාරී යන තනතුරු වර්ෂ එකත් දෙකත් අතර කාලයක් පුරප්පාඩුව පැවතියද අදාළ තනතුරු වලට සුදුසුකම් ලත් නිලධාරීන් පත්කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අධිකාරියේ අරමුණු සහ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |